## නිපුණතා සංවර්ධන සහ වෘත්තීය පුහුණු අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

# පුරප්පාඩු තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම

මෙම අධිකාරියේ පුරප්පාඩුව පවතින **සහකාර අධ්‍යක්ෂ** (මානව සම්පත් හා පරිපාලන) හා **සහකාර අධ්‍යක්ෂ** (වෘත්තීය මාර්ගෝපදේශන, රැකියාගත කිරීම් හා ප්‍රවර්ධන) තනතුරු සඳහා බඳවා ගැනීමට පහත සඳහන් සුදුසුකම් සපුරාලන ලද, කුසලතා පූර්ණ, කාර්යශූර, විශිෂ්ට චරිතයකින් යුත් ශ්‍රී ලාංකීය පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**බඳවා ගැනීමේ සුදුසුකම්:**

- විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.

සහ

- උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම.

**වයස් සීමාව:**

අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් ක්‍රමය:**

MM 1-1-2016: -රු. 53,175/- 10 x 1375 - 15 x 1910 - 95,575/-
(2017.01.01 දිනට මූලික වැටුප රු. 36,654/-. ගැලපුම් දීමනාව රු. 4,114/- කි. මීට අමතරව රජයේ අනුමත දීමනා හිමි වේ.)

**බඳවා ගැනීමේ ක්‍රමවේදය:**

ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි විවෘත තරඟ විභාගයකින් හා / හෝ පත්වීම් බලධාරියා විසින් පත් කෙරෙන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගනු ලැබේ.

ඉහත තනතුරු ස්ථිර, සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිතය.

මේ සඳහා සුදුසුකම් ඇති අය තමන් විසින් සකසන ලද අයදුම්පත් පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කල යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහල කෙලවරේ "(අයදුම්කරන තනතුර) සඳහා බඳවා ගැනීම" යනුවෙන් සඳහන් කර එවිය යුතුය.

නිසි පරිදි සම්පූර්ණ කර නොමැති, අදාල සුදුසුකම් සපුරා නොමැති හා අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර, එක් තනතුරකට වඩා වැඩි ගණනකට එක් අයදුම්කරුවකු අයදුම් කරන්නේ නම් ඒ ඒ තනතුර සඳහා වෙන් වෙන් වශයෙන් අයදුම්පත් යොමු කල යුතුය.

බඳවා ගැනීමේදී ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ සභාපති/අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය:- **2017 ජුනි මස 28 දින.**

**සභාපති**
**ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය**
**"නිපුණතා පියස" 04 වැනි මහළ,**
**අංක 354/2, ඇල්විටිගල මාවත,**
**නාරාහේන්පිට, කොළඹ 05.**
**දුරකථන: 0112352100**